SC

# "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාව තුළ සියදිවිනසා ගැනීම හා සම්බන්ධ සමාජ විද්‍යාත්මක ඇගයීමක්."

(රත්නපුර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බල ප්‍රදේශය ඇසුරිනි.)

කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (සමාජ විද්‍යාව) පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධනය.

කේ. සමිත සුධීශ්වර පෙරේරා
FGS/S/MSSc/2004/08

සමාජ විද්‍යා අධ්‍යයනාංශය,
කැළණිය විශ්වවිද්‍යාලය,

2006 (නොවැම්බර්)

ප්‍රවේශ අංකය 488
වර්ග අංකය

## සාරාංශය.

සියළු සත්වයින් සේම මිනිසාද දිගු කාලීන ජීවිතාපේක්ෂාව ඇති ජීවියෙකු වුවද, මානව සංහතියේ ආරම්භය සිදු වූයේ කවදා කොතැනකින්ද, එදා පටන් අනුකරණාත්මක ක්‍රියාවක්, සිරිතක් හෝ ව්‍යාධිමය තත්ත්වයක් නිසාවෙන් ඔවුන් සියදිවි නසා ගැනීමට පෙළැඹී ඇති බවට සාක්ෂි ඇත. මිනිස් සංහතියේ ආරම්භය තෙක් දිව යන සියදිවි නසා ගැනීම, ස්වාභාවික මරණ හා මනුෂ්‍ය ඝාතන තරමටම ඉපැරණි සමාජ සංසිද්ධියක් ලෙස පිළිගැනෙන්නේ එබැවිනි. ලොව පුරා වසරකට සිදුවන සියදිවි නසා ගැනීම් සංඛ්‍යාව ලක්ෂ 10 ඉක්මවන බව සංඛ්‍යා ලේඛන වලින් සනාථ වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ මෙය ඉතාමත් ප්‍රබල, වර්ධනීය සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇති බවයි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවට අදාළව කරනු ලබන මෙම අධ්‍යයනය වඩාත් සුවිශේෂී එකක් වන්නේ කවර තිරණායකට අනුව වුව විමසා බැලීමේදී ලොව සෙසු රටවලට සාපේක්ෂව මෙරට ජන සමාජය තුළ මෙය ඉතා ඉහළ අනුපාතයක් දරණ, වහාම නිවාරණාත්මක හා ප්‍රතිකාරාත්මක මානයන් කරා යොමු විය යුතු සංකීර්ණ විෂම බලවේගයක් ලෙසින් ඔඩු දුවා ඇති බැව් ප්‍රත්‍යක්ෂ වන නිසාවෙනි. අතීත ශ්‍රී ලාංකේය සමාජය තුළ මනුෂ්‍ය ඝාතන හා සියදිවි නසා ගැනීම් ඉතා විරල සංසිද්ධීන් වූ බැව් ජෝන් ඩේවි හා ජෝන් ඩොයිලි ආදී බ්‍රිතාන්‍ය ජාතිකයින් ගේ වාර්තා ඇසුරින් සනාථ වේ. 1880 දී ශ්‍රී ලංකාව තුළ වාර්තා වී ඇති සමස්ත සියදිවි නසා ගැනීම් සංඛ්‍යාව 64 ක් පමණක් වුවත්, ඉන් ගත වර්ෂයක ඇවෑමෙන්, එනම් 1980 වන විට එම අගය 5129 දක්වා ඉතා ශීඝ්‍ර ලෙස වර්ධනය විය. එය ලක්ෂයක ජනගහන ඒකකයට 2.3 ක්ව තිබූ අනුපාතය, එම ඒකකය තුළ 42 දක්වා ඉහළ යාමකි. 21 වෙනි සියවස දක්වා එම තත්ත්වය තව තවත් උග්‍ර අතට හැරුණා මිස, එහි අඩු වීමක් දක්නට නොලැබිණි. නමුත්, රාජ්‍ය මට්ටමින්, රාජ්‍ය නොවන සංවිධාන හා ස්වේච්ඡා සංවිධාන මට්ටමින් ඒ පිළිබඳව අවධානය යොමු කොට, හඳුනාගත් ප්‍රදේශ හා අවදානම් සහගත කණ්ඩායම් ඉලක්ක ගත කොට දියත් කරනු ලැබූ නියමු ව්‍යාපෘතීන් හේතුවෙන් 21 වෙනි සියවස ආරම්භයත් සමග එම වාර්ෂික සියදිවි නසා ගැනීම් වල ක්‍රමික අඩු වීමක් සිදු විය. කෙසේ වෙතත්, රටක සංවර්ධන උපාය මාර්ගයන් අඩ පණ කරනු ලබන මෙම වර්ධනීය සමාජ ප්‍රශ්නයේ භයංකාර අඳුරු සෙවනැළි තවමත් මෙරට දුෂ්කර, ග්‍රාමීය ප්‍රදේශ හරහා වැටී ඇති බව පොලිස්පති තුමාගේ වාර්ෂික පාලන වාර්තා පරිශීලනය කර බැලීමේදී පෙනේ.

මෙම අධ්‍යයනයේදී දාර්ශනික, ආගමික, මනෝ විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා නෛතික යන ප්‍රධාන විග්‍රහයන් 05 ක් ඔස්සේ සියදිවි නසා ගැනීම සමාජ සංසිද්ධියක් ලෙස හඳුනා ගැනීමට උත්සාහ කරන ලද අතර, සියදිවි නසා ගැනීමට අදාලව ජාත්‍යන්තර හා දේශීය වශයෙන් කරන ලද සමාජ පර්යේෂණ හරහා

ගොඩ නගන ලද එම සංකල්ප හා නිර්වචන තුළින් මැනවින් පෝෂිත සාහිත්‍යයක් පරිශීලනය කළ හැකි විය. නමුත් මේ සා පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වී ඇති සියදිවි නසා ගැනීමේ සාහිත්‍යය තුළ විද්‍යමාන වූ පරතරයක් මවිසින් හඳුනා ගනු ලදිමි. එනම් ජාත්‍යන්තර වශයෙන් මීට අදාළ අධ්‍යයනයන් සඳහා ප්‍රධාන වශයෙන්ම ඉලක්ක ගත වී තිබුණේ නාගරික සමාජ සැකැස්ම වීමත්, මෙරට අඛණ්ඩව සැළකිය යුතු කාලයක් වැඩිම වාර්ෂික සියදිවි නසා ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වූ රත්නපුර දිස්ත්‍රික්කය දේශීය සමාජ පර්යේෂකයින්ගේ අවධානයෙන් ගිලිහී යාමත්ය. ග්‍රාමීය ප්‍රජාව තුළ සියදිවි නසා ගැනීමේ ප්‍රේරණයන් හඳුනා ගැනීම සඳහා අධ්‍යයනය ඉලක්ක ගත වූ අතර, ඊට අදාල ක්ෂේත්‍රය වශයෙන් ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කය තෝරා ගන්නා ලද්දේ එකී පරතරය යම් පමණකින් හෝ පියැවීමේ අරමුණ ඇතිවය.

මෙම අධ්‍යයනයේ ගැටළුව වූයේ, 'ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාව අතර සියදිවි නසා ගැනීම කෙරෙහි බලපානු ලබන සමාජ, ආර්ථික, සංස්කෘතික හා පාරිසරික සාධක කවරේද ?' යන්නයි. ග්‍රාමීය ප්‍රජාව අතර සියදිවි නසා ගැනීමේ විවිධත්වය විවිධ නිර්ණායක භාවිතයෙන් විභාග කර බැලීම අධ්‍යයනයේ ප්‍රධානතම අරමුණ වූ අතර, දෙස් විදෙස් සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින් හා මනෝ විද්‍යාඥයින් සියදිවි නසා ගැනීමට අදාළව කර ඇති නිගමනයන් සමග මෙරට වත්මන් තත්ත්වය සසඳමින්, තුලනාත්මකව සතෝක්ෂණය කර බැලීම තවත් එක් සුවිශේෂී අරමුණක් විය.

අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන්ම භාවිත ක්‍රම වේදය වූයේ, ප්‍රත්‍යෙක අධ්‍යයන ක්‍රමයයි. 2004 වසරේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ සියදිවි නසා ගත් පුද්ගලයින් 364 දෙනා අතරින් අහඹු ලෙස තෝරා ගත් 10 දෙනෙකු අධ්‍යයනයේ නියැදිය විය. මෙම පුද්ගලයින් 10 දෙනා ඇසුරෙන් සිද්ධි අධ්‍යයනය කරන ලද අතර, ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් යොදා ගන්නා ලද්දේ එම සියදිවි නසා ගත් පුද්ගලයින්ගේ පවුල් වල ඥාතීන්, අසල් වාසීන් ඇසුරෙන් ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් මතු කර ගන්නා ලද තොරතුරුය. අදාළ ග්‍රන්ථ පරිශීලනයට අමතරව; පොලිස් වාර්තා, අධිකරණ නඩු වාර්තා, හදිසි මරණ පරීක්ෂක වාර්තා, පොලිස්පති පාලන වාර්තා, පුවත්පත් හා සඟරා ආදියෙන් උපුටා ගත් දත්ත හා තොරතුරු අධ්‍යයනයේ ද්විතීයික මූලාශ්‍ර වශයෙන් යොදා ගැණින. දත්ත විශ්ලේෂණ ක්‍රියාවලිය, සංඛ්‍යා සටහන්, ප්‍රස්ථාර සටහන්, රූප සටහන් හා සිතියම් උපයෝගී කොට ගනිමින්; ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් සිදු කිරීමට කටයුතු කළෙමි.

අධ්‍යයනයේ ප්‍රධාන නිරීක්ෂණ අතරින්, ශ්‍රී ලංකාවේ බොහෝ කලෙක පටන් සියදිවි නසා ගැනීමේ පොදු ලක්ෂණ ත්‍රිත්වය වන කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂයින්

අතර සියදිවි නසා ගැනීමේ ඉහළ අනුපාතය, සියදිවි නසා ගැනීමට බලපානු ලබන ප්‍රධානතම හේතු සාධකය බවට පවුල් ආරවුල් පත්ව තිබීම, උපක්‍රමයක් ලෙස බහුල වශයෙන්ම වස පානය කිරීම එලෙසින්ම ක්ෂේත්‍රය තුළින්ද නිරීක්ෂණය වීම කැපී පෙනේ. මීට අමතරව, සෙසු නිරීක්ෂිත තත්ත්වයන් අතර; සියදිවි නසා ගැනීම පිළිබඳව ජන මාධ්‍ය හරහා සිදුවන දුශ් - වාර්තාකරණය, සංඛ්‍යා ලේඛනවල දෝෂ සහගත විශ්ලේෂණයන් හා කැපී පෙනෙන පරස්පරතාවයන් පැවතීම, සියදිවි නසා ගැනීම හා මනුෂ්‍ය ඝාතනය යන ද්විත්ව ක්‍රියාවලිය එකවර සිදුවීමේ ප්‍රවණතාවය, ජන සමාජය තුළ සියදිවි නසා ගැනීමට අදාළව මුල් බැස ගෙන ඇති මිථ්‍යා මත හා දුර්මතවාද නිසා වළක්වා ගත හැකිව තිබූ අවස්ථා මග හැරී යාම ප්‍රධාන වේ.

ඒක - හේතුක නොවන; සංකීර්ණ බහු - හේතුක විෂම ජාලයක ගොදුරක් බවට පත් වීමෙන් පුද්ගලයා සියදිවි නසා ගැනීමට පෙළැඹෙන බව හා සියදිවි නසා ගැනීම සඳහා කරනු ලබන 'තැත් කිරීම්' පිළිබඳව අවධානයකින් තොරව; සියදිවි නසා ගැනීමේ සංඛ්‍යාත්මක දත්ත පමණක් ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය මැනීමේ දර්ශකයක් කොට සළකා කරනු ලබන අධ්‍යයනයන් තුළින් දෝෂ සහගත නිගමනයන් ලබා දෙන බව මෙම අධ්‍යයනයේ නිගමන අතර ප්‍රධාන විය.

මෙරට ජන සමාජය තුළ සියදිවි නසා ගැනීමට අදාළ නිවාරණාත්මක ආකල්පයක් ස්ථාපිත කිරීම සඳහා; ග්‍රාමීය ප්‍රජාව තුළ මානසික රෝග හා මනෝ ප්‍රතිකාරාත්මක අංශය පිළිබඳව දැනුවත් භාවයක් ඇති කිරීම, ස්වයං වාරණයක් සහිත නිවැරදි මාධ්‍ය භාවිතයක් කරා මාධ්‍යකරුවන් යොමු වීම, මීට අදාළ රාජ්‍ය මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇති කිරීම, සියදිවි නසා ගැනීමට තැත් කළ පුද්ගලයින් ඊට අදාළ නෛතික රාමුවකට ඇතුළත් කිරීමේදී එය ප්‍රවේශමෙන් සිදු කිරීම, පවුල් සංවිධානාත්මක හා මනෝ උපදේශනාත්මක වැඩ සටහන් හා ව්‍යාපෘතීන් දීප ව්‍යාප්තව දියත් කිරීම, නිධන්ගත රෝග වැළැක්වීම සඳහා පිළිගත් ආරක්ෂිත කෘමි නාශක හා පළිබෝධ නාශක භාවිත ක්‍රම කෘෂි ප්‍රජාවට හඳුන්වා දීම, සියදිවි නසා ගැනීම පිළිබඳව පුළුල්, නිවැරදි සමාජ කතිකාවතක් සිවිල් ජන සමාජය තුළ ඇති කිරීම යනාදිය අධ්‍යයනයේ යෝජනා ලෙස ඉදිරිපත් කොට ඇත.